1994

# ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ

# ව්‍යවස්ථාව

BKT0204
26/08/2023

ජනාධිපති ලේකම් කාර්යාලය
17 JUN 2002
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# 1994 ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යවස්ථාව
# ස්වස්ති සිද්ධම්
# පක්ෂයේ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මූලික ප්‍රතිපත්තිය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදයයි. එනම් මැද පිළිවෙතයි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදයේ මූලධර්මයක් වූ විවිධ පෞද්ගලික සහ සාමූහික නිදහස් රැසකි. මේ නිදහස් ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යාවශ්‍ය අංග ලක්ෂණයන් සේ අප විසින් සළකනු ලැබේ. නිදහස්ව කල්පනා කිරීම, සහ අදහස් ප්‍රකාශ කිරීම, රැස්වීම් පැවැත්වීම, ආගම ඇදහීම, ඡන්ද බලය පාවිච්චි කිරීම යනාදිය පෞද්ගලික නිදහස වශයෙන් අප විසින් සළකනු ලැබේ. අගහිඟකමෙන්, බියෙන්, නුගත් කමින් හා රෝග පීඩාදියෙන් නිදහස් වීම සාමූහික නිදහස වශයෙන් අප විසින් සලකනු ලැබේ. ජනයාගේ නිදහස් ඡන්ද බලයෙන් තෝරා ගනු ලබන පාර්ලිමේන්තුවක් මගින් ආණ්ඩු කිරීම පාලන තන්ත්‍රයෙහි කාර්‍යක්ෂමබාවය සහ අපක්ෂපාතිත්වය ද අධිකරණයෙහි ස්වාධීනත්වයද ප්‍රජාතන්ත්‍ර වාදයෙහි මූලධර්මයන් සේ අප විසින් සලකනු ලැබේ.

රටේ ජනතාවගේ සුභ සිද්ධිය පිණිස රජයේ මුළු ශක්තිය යෙදවීමද සැම දෙනාටම එක හා සමාන අවස්ථාවක් ලබාදීමද එසේ කිරීමෙන් පන්ති විරහිත සමාජයක් බිහි කරවීමද සමාජවාදී මූල ධර්මයක් සේ අප පිළිගනිමු.

එසේ එක් අතකින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් වන සමාජවාදය කරා යන ගමන ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් යටතේ සිදුවන බැවින් ඒකාධිපති ක්‍රමයකට පටහැනි වන අතර බලහත්කාර කම් වලින් තොරව මහජනතාවගේ අදහස් වලට එකඟව ක්‍රමානුකූලව කෙරෙන බවත්, අනිත් අතින් ප්‍රජාතන්ත්‍රවාදී ධනේශ්වරයේ ප්‍රතිඵලයක් වශයෙන් සුළු පිරිසක් විසින් භුක්ති විඳින වරප්‍රසාද ජනතාවගේ යහපත පිණිස සීමා කළ යුතු බවද අපගේ විශ්වාසයයි.

මේ අපගේ දෙයාකාරවූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සිද්ධාන්තයන්ට තුන්වැනි අංග ලක්ෂණයක් අන්තර්ගත කළ යුතුයි. එනම් ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය හා සංවර්ධනයයි.

**(මේ ප්‍රතිපත්ති වලට අනුකූලව සැළසුම් සකස් කර ගත හැකිය.)**

## 1 වන වගන්තිය

(I) පක්ෂයේ නම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වන්නේය.

(II) පක්ෂයේ මැතිවරණ සලකුණ 'අත' වන්නේය.

(III) පක්ෂයේ වර්ණය නිල වන්නේය.

## 2 වන වගන්තිය

**(අ) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පහත දැක්වෙන ප්‍රධාන සංවිධාන වලින් යුක්ත වන්නේය.**

(I) ශාඛා සමිති

(II) මැතිවරණ බල ප්‍රදේශ සංවිධාන
(III) ප්‍රාදේශීය සංවිධාන
(IV) දිස්ත්‍රික් කාරක සභාව
(V) සමස්ථ ලංකා කාරක සභාව
(VI) විධායක සභාව
(VII) මධ්‍යම කාරක සභාව
(VIII) විනය මණ්ඩලය
(IX) උපදේශක සභාව
(X) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානය
(XI) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාන්තා සංවිධානය
(XII) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මහා සම්මේලනය

**(ආ) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ පහත දැක්වෙන අනුබද්ධ සංවිධාන පිහිටුවිය හැකිය.**

(I) ශ්‍රී ලංකා නිදහස් පැවිදි සංවිධානය
(II) ශ්‍රී ලංකා නිදහස් වෛද්‍ය සංවිධානය
(III) ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමය
(IV) ශ්‍රී ලංකා නිදහස් ගොවි සංවිධානය
(V) ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිති සම්මේලනය
(VI) ශ්‍රී ලංකා නිදහස් රජයේ වෘත්තීය සමිති සම්මේලනය
(VII) ශ්‍රී ලංකා නිදහස් ශිෂ්‍ය සංවිධානය
(VIII) ශ්‍රී ලංකා නිදහස් ධීවර හා ගෘහකාර්මික සංවිධානය
(IX) ශ්‍රී ලංකා නිදහස් සංස්කෘතික සංවිධානය
(X) ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංවිධානය

## 3 වන වගන්තිය

### 1 ශාඛා සමිති

(අ) අදාල මැතිවරණ බල ප්‍රදේශය තුල පිහිටි එක් එක් ඡන්ද පොලකට හෝ ග්‍රාමසේවා නිළධාරී වසමකට යටත් පිරිසෙයින් එක් ශාඛා සමිතිය බැගින් පිහිටුවිය යුතුය.

(ආ) ශාඛා සමිති පිහිටු විය යුතු ඡන්ද පොලේ හෝ ග්‍රාමසේවා නිළධාරී වසමේ හෝ අනු කොටස් අදල මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය මගින් තීරණය කරනු ඇත.

(ඇ) ශාඛා සමිතියක් පිහිටුවීමට අවම වශයෙන් (20) විසි දෙනෙකු සිටිය යුතුය. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ අවසරය ඇතිව, උසස් අධ්‍යාපන ආයතන හා වෙනත් ආයතන වලද, පක්ෂ ශාඛා පිහිටුවිය හැකිය. එම විශේෂ පක්ෂ ශාඛා පක්ෂයේ මධ්‍යම කාරක සභාව තීරණය කරන, සංවිධාන වලට සම්බන්ධ විය යුතුය.

## 4 වන වගන්තිය

ශාඛා සමිතියක් විසින් පහත දැක්වෙන නිළධාරී මණ්ඩලය තෝරා පත්කර ගත යුතුය.

සභාපති
උප සභාපති
ලේකම්
උප ලේකම්
භාණ්ඩාගාරික
කාරක සභිකයින් (06) හය දෙනෙක්.
අවශ්‍යතා අනුව අනුශාසකවරු පත්කර ගත හැකිය.

## 5 වන වගන්තිය

### මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය

(අ) (I) පක්ෂයේ සභාපති විසින් සෑම මැතිවරණ බල ප්‍රදේශයකටම සංවිධායකයකු බැගින්, පත්කළ යුතුයි.

(II) අදාල මැතිවරණ බල ප්‍රදේශ තුල ඇති ශාඛා සමිති වල සභාපතිවරු හා ලේකම්වරු නිල බලයෙන් මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ සාමාජිකයින් ලෙස පත්වේ.

(III) අදල මැතිවරණ බල ප්‍රදේශ තුල ඇති පළාත් පාලන ආයතන සඳහා තෙරී පත්වී සිටින, පක්ෂයේ සාමාජිකයින් හා පළාත් සභා සඳහා තේරී පත්ව සිටින, අදල මැතිවරණ බල ප්‍රදේශය තුල පදිංචිව සිටින, පක්ෂ සාමාජිකයින්ද නිල බලයෙන් මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ සාමාජිකයින් ලෙස පත් වේ.

(ආ) මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ නිළධාරී මණ්ඩලය

(I) මැතිවරණ බල ප්‍රදේශ සංවිධායක මෙම සංවිධානයේ සභාපති වශයෙන් නිල බලයෙන්ද, උප සභාපතිවරු (05) පස්දෙනෙක්, ලේකම්, උප ලේකම්වරු (5) පස්දෙනෙක්, භාණ්ඩාගාරික, කාරක සභිකයින් (14)දාහතර දෙනෙකුගෙන්ද නිළධාරී මණ්ඩලය සමන්විත වේ.

(II) නිළධාරී මණ්ඩලය ඇතුළු කාරක සභාව මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලය වන්නේය.

## 6 වන වගන්තිය

### මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ බලතල හා යුතුකම

(I) මෙම සංවිධානය මැතිවරණ බල ප්‍රදේශය තුල, පක්ෂය වෙනුවෙන් සියළු කටයුතු ඉටුකල යුතුය.

(II) අදාල සංවිධානයේ යෝජනා සම්මතයකින් පසුව මුදල් එකතු කිරීමටමැතිවරණ බල ප්‍රදේශ සංවිධානයට බලය තිබේ. එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර, පක්ෂයේ මුදල් කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

(III) මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ලබාගෙන බැංකු ගිණුම් පවත්වා ගෙන යාමට මෙම සංවිධානයට බලය තිබෙන අතර, සංවිධානයේ අයවැය වාර්ෂිකව සභා සම්මත කොට, එහි වාර්තා පිටපතක් පක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතුය.

(IV) මෙම සංවිධානය යටත් පිරිසෙයින් (06) හය මසකට වරක් රැස්විය යුතු අතර, ක්‍රියාකාරී මණ්ඩලය යටත් පිරිසෙයින් (03) තුන් මසකට වරක් රැස්විය යුතුය.

(V) සාමාජික යුතුකම් පැහැර හරින හෝ පක්ෂ විරෝධී ක්‍රියා කරන සාමාජිකයින් පිළිබඳව ලැබෙන පැමිණිලි මෙම සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලය විසින් සොයා බලා, එවැනි සිද්ධීන් සම්බන්ධව විනයානුකූල පියවරක් ගැනීමට අවශ්‍ය නම් ඒ සම්බන්ධ වාර්තාවක් අප්‍රමාදව පක්ෂයේ ප්‍රධාන ලේකම් වරයා වෙත එවිය යුතුයි.

(VI) මෙම සංවිධානය වෙනුවෙන් තිකුත් කරන ලිපි සංවිධායකවරයා විසින් හෝ ඔහුගේ අනුමැතිය පරිදි ලේකම් විසින් හෝ කළ යුතුය.

## 7 වන වගන්තිය

### ප්‍රාදේශීය සංවිධාන

(I) පළාත් පාලන ආයතන වැඩි ගණනාවක් අයත් වන යම් මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයකට අවශ්‍ය යයි හැගේ නම් පමණක් පළාත් පාලන මට්ටමෙන් ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීමට අවකාශ ඇත.

(II) පළාත් පාලන බල ප්‍රදේශය තුල ඇති පක්ෂ ශාඛාවල සභාපති වරුන් සහ ලේකම් වරුන් වශයෙන් තේරී පත්වන නියෝජිතයන්ගෙන් මෙම සංවිධානය සමන්විත වේ.

(III) මෙම සංවිධානයට සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික සහ නිළධාරීන් පත් කර ගැනීමට හැකි වන අතර, එම තිදෙනා නිළ බලයෙන් මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලයට තේරී පත්වේ.

## 8 වන වගන්තිය

### දිස්ත්‍රික් කාරක සභාව

දිස්ත්‍රික්කය තුල පිටින සංවිධායකවරුන්ට අදාල දිස්ත්‍රික්කය තුල පක්ෂ කටයුතු සම්බන්ධීකරණය කිරීම පිණිස යෝග්‍ය පරිදි දිස්ත්‍රික් කාරක සභාවක් පත් කර ගත හැකිය.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## 9 වන වගන්තිය

**සමස්ත ලංකා කාරක සභාව**

**(අ) සමස්ත ලංකා කාරක සභාව පහත සඳහන් පරිදි ස්ථාපිත විය යුතුයි.**

(I) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නිළ බලයෙන්

(II) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මැතිවරණ බල ප්‍රදේශ සංවිධානවල සභාපතිවරු සහ ලේකම්වරු නිළ බලයෙන්

(III) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානයෙන් තෝරා එවනු ලබන (50) පනහකට නොවැඩි නියෝජිතයින්

(IV) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාන්තා සංවිධානයෙන් තෝරා එවනු ලබන (30) තිහකට නොවැඩි නියෝජිතවරියන්

(V) ශ්‍රී ලංකා නිදහස් පැවිදි, වෛද්‍ය, ගුරු, ගොවි, ශිෂ්‍ය, ධීවර හා ග්‍රාම කාර්මික, සංස්කෘතික, නීතිඥ යන අනුබද්ධ සංවිධාන විසින් තෝරා එවනු ලබන එක් සංවිධානයකින් (10) දහදෙනෙකුට නොවැඩි වන නියෝජිතයින්

(VI) ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිති සම්මේලනය විසින් තෝරා එවනු ලබන (30) තිස් දෙනෙකුට නොවැඩි නියෝජිතයින්

(VII) ශ්‍රී ලංකා නිදහස් රජයේ වෘත්තීය සමිති සම්මේලනය විසින් තෝරා එවනු ලබන (20) විසි දෙනෙකුට නොවැඩි නියෝජිතයන්

(VIII) පක්ෂයේ සභාපති විසින් නම් කරනු ලබන (50) පණහකට නොවැඩි සාමාජිකයින්

**(ආ) ඉහත සඳහන් අංක III සිට VII දක්වා ඇති සංවිධාන වලින් තෝරා එවනු ලබන සියළුම නම් පක්ෂයේ මධ්‍යම කාරක සභාවෙන් අනුමත විය යුතුයි.**

## 10 වන වගන්තිය

**සමස්ත ලංකා කාරක සභාවේ බලතල සහ වගකීම්:**

(I) පක්ෂයේ ප්‍රතිපත්ති හැර, අනෙකුත් ව්‍යවස්ථා සංශෝධනය කිරීමට සමස්ත ලංකා කාරක සභාවට බලය තිබේ.

(II) සමස්ත ලංකා කාරක සභාව යටත් පිරිසෙයින් (06) හයමසකට වරක් රැස්විය යුතුයි.

(III) සමස්ත ලංකා කාරක සභාව, පක්ෂයේ සභාපතිට අවශ්‍ය යැයි හැගෙන යම් කිසි අවස්ථාවකදී කැඳවීමට බලය තිබේ.

## 11 වන වගන්තිය

**විධායක සභාව**

**පක්ෂයේ විධායක සභාව පහත සඳහන් පරිදි ස්ථාපිත විය යුතුයි.**

(I) පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නිළ බලයෙන්

(II) මැතිවරණ බල ප්‍රදේශ සංවිධායකවරුන් නිළ බලයෙන්

(III) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානය නියෝජනය කරන, සමස්ථ ලංකා කාරක සභාවේ සාමාජිකයන් අතුරෙන් (05) දෙනෙක්

(IV) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාන්තා සංවිධානය නියෝජනය කරන සමස්ත ලංකා කාරක සභිකයන් අතුරෙන් (03) තුන් දෙනෙක්

(V) ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පැවිදි, වෛද්‍ය, ගුරු, ගොවි, ධීවර හා ගෘහ කාර්මික, ශිෂ්‍ය, සංස්කෘතික හා නීතිඥ යන අනුබද්ධ සංවිධානවල සමස්ත ලංකා කාරක සභාව නියෝජනය කරන, එක් සංවිධානයකින් (02) දෙදෙනෙකු බැගින්.

(VI) ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිති සම්මේලනය නියෝජනය කරන, සමස්ත ලංකා කාරක සභිකයන් අතුරෙන් (03)තුන් දෙනෙක්ද, ශ්‍රී ලංකා රජයේ වෘත්තීය සමිති සම්මේලනය නියෝජනය කරන සමස්ත ලංකා කාරක සභිකයන් අතුරෙන් (02) දෙදෙනෙකු බැගින්ද

(VII) පක්ෂයේ සභාපති විසින් සමස්ථ ලංකා කාරක සභිකයින් අතුරෙන් පත් කරන (25) විසි පස් දෙනෙකුගෙන්ද මෙම විධායක සභාව ස්ථාපිත විය යුතුය.

## 12 වන වගන්තිය

**විධායක සභාවේ බලතල හා වගකීම්:**

(I) විධායක සභාව පහත සඳහන් නිලධාරී මණ්ඩලය තෝරා ගත යුතුය.

සභාපති, නියෝජ්‍ය සභාපති, උප සභාපති වරු නව දෙනෙක් (09), ප්‍රධාන ලේකම්, උප ලේකම්වරු හය දෙනෙක් (06) ජාතික සංවිධායක, භාණ්ඩාගාරික.

(II) ප්‍රතිපත්ති හා ව්‍යවස්ථා සංශෝධන යෝජනා කෙටුම්පත් කිරීමට විධායක සභාවට බලය තිබේ.

(III) මධ්‍යම කාරක සභාව විසින් පවරනු ලබන පරිදි, සියළු මැතිවරණ වලදී සහ පක්ෂයේ වෙනත් කටයුතු වලදී අවශ්‍ය කාර්යයන් සංවිධානය කිරීම විධායක සභාවට පැවරේ.

(IV) පක්ෂයේ මුදල් පාලනය සඳහා විධායක සභාව විසින් මුදල් කාරක සභාවක් පත්කළ යුතුයි. යන්නයි.

(V) විධායක සභාව යටත් පිරිසෙයින් (03) තුන් මසකට වරක්වත් රැස්විය යුතුයි.

## 13 වන වගන්තිය

**මධ්‍යම කාරක සභාව පහත සඳහන් පරිදි ස්ථාපිත විය යුතුයි.**

(I) විධායක සභාව විසින් තෝරාපත් කර ගන්නා නිළධාරීන් 20 දෙනා.

(II) 'විධායක සභාවේ සාමාජිකයන් අතුරෙන් පක්ෂයේ සභාපති විසින් පත් කරනු ලබන (17) දහත් දෙනෙකුට වැඩි නොවන සාමාජිකයින්.'

## 14 වන වගන්තිය

**මධ්‍යම කාරක සභාව සතු බලතල සහ කාර්‍ය භාරය:**

(I) මෙය පක්ෂයේ උත්තරීතර සභාව වන්නේය.

(II) පොදුවේ පක්ෂය පිළිබඳව මෙන්ම පක්ෂ ව්‍යවස්ථාවේ කවර අංගයක් පිළිබඳවද මෙම සභාව විසින් දෙනු ලබන තීරණ අවසාන තීරණ වේ.

(III) මෙම ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ නිර්දිෂ්ට කවරම සංවිධානයක හෝ ඒවායේ සාමාජිකයකුගේ හෝ නිලධාරියෙකුගේ හෝ නියෝජිතයකුගේ හෝ මැතිවරණ බල ප්‍රදේශ සංවිධායක වරයෙකුගේ ක්‍රියා කලාපය පක්ෂයේ ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග, තීරණ වලට පටහැනි යැයිද නැතහොත් පක්ෂයට හානිකරයයිද, මධ්‍යම කාරක සභාවට ඒත්තු ගිය හොත් එම සංවිධානයේ හෝ සාමාජිකයාගේ හෝ නියෝජිතයාගේ හෝ නිළධාරියාගේ වැඩ තහනම් කොට ඒ පිළිබඳව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට මෙම සභාවට බලය තිබේ.

(IV) පක්ෂ සාමාජිකයෙකු හෝ සංවිධානයක් පක්ෂයේ ප්‍රතිපත්ති උල්ලංඝනය කළ විට හෝ පක්ෂ විනය කඩකළ විට හෝ පක්ෂයට අහිතකර අන්දමට ක්‍රියා කළ විට හෝ ඒ ගැන නිර්දේශයක් සහිත වාර්තාවක් මෙම ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් සංවිධානයකින් පක්ෂයේ ප්‍රධාන ලේකම් වෙත එවීමෙන් පසු, හෝ වෙනත් ආකාරයකින් ප්‍රධාන ලේකම් වරයාට ඒත්තු ගිය විට ඔහු චූදිත සාමාජිකයාගෙන් හෝ සංවිධානයෙන් නිදහසට කරුණු විමසා ඒ පිළිබඳ වාර්තාවක් විනය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. විනය මණ්ඩලය විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා තම තීරණය මධ්‍යම කාරක සභාවට වාර්තා කළ යුතු අතර, එම වාර්තාව සලකා බලා අදාල සාමාජිකයා සම්බන්ධව පක්ෂයෙන් නෙරපීම ඇතුළු වෙනයම් ක්‍රියා මාර්ගයන් ගැනීමටද, සංවිධානයක් නම් එම සංවිධානයේ වැඩ කටයුතු තහනම් කිරීමටද මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

(V) මධ්‍යම කාරක සභාවේ විශේෂ රැස්වීම් කැඳවීමට පක්ෂයේ සභාපතිට බලය තිබේ.

(VI) අවශ්‍යතා අනුව විනය මණ්ඩලය, නාම යෝජනා මණ්ඩලය ඇතුළු විවිධ මණ්ඩල ඇතුළු විවිධ මණ්ඩල හා විවිධ කමිටු පත් කිරීමට පක්ෂයේ මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

(VII) අවශ්‍ය නම් සාමාජිකයකුගේ සාමාජිකත්වය තහනම් කිරීමටත් සංවිධානයක් නම් එහි වැඩ කටයුතු තහනම් කිරීමටත් පක්ෂයේ සභාපතිට බලය තිබේ.

(VIII) එසේ යම් සාමාජිකයකුගේ හෝ සංවිධානයක හෝ වැඩ කටයුතු තහනම් කරනු ලැබූ අවස්ථාවක පක්ෂයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විධි විධාන යෙදීමට මධ්‍යම කාරක සභාවට බලය ඇත.

## 15 වන වගන්තිය

### විනය මණ්ඩලය:

පක්ෂයේ සියළු අංශවල දැඩි විනයක් පවත්වා ගැනීම පිණිස අවශ්‍ය ක්‍රියා මාර්ග යෙදීමට මධ්‍යම කාරක සභාව විසින් (05) පස් දෙනෙකුගෙන් සමන්විත විනය මණ්ඩලයක් පත්කළ යුතුය. මෙම විනය මණ්ඩලයේ වගකීම් හා කාර්ය භාරය සහ එක් එක් විනය පරීක්ෂණ සඳහා විනය මණ්ඩලයෙන්, පත් කෙරෙන සාමාජික සංඛ්‍යාවද, පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

## 16 වන වගන්තිය

### උපදේශක සභාව:

සෑම දිස්ත්‍රික්කයකින්ම පත් කරනු ලබන එක් නියෝජිතයකු බැගින්ද විවිධ අංශයන් පිළිබඳ විශේෂ දැනුමක් ඇති පුද්ගලයන්ද ඇතුළත් වන සේ මධ්‍යම කාරක සභාව විසින් උපදේශක සභාවක් පත්කළ යුතුය. මෙම උපදේශක සභාවේ කාර්යයන් මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ඇත.

## 17 වන වගන්තිය

### ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහා සම්මේලනය

(අ) ඉහත සඳහන් මහා සම්මේලනය යටත් පිරිසෙයින් වර්ෂ (02) දෙකකට වරක්වත් කැඳවිය යුතුය.

(ආ) මහා සම්මේලනය කැඳවිය යුතු කාලවකවානු මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

(ඇ) පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සභිකයින්, සමස්ත ලංකා කාරක සභාවේ සභිකයින්, මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලයෙන් තෝරා ගත් (05) පස් දෙනෙකු බැගින්, තරුණ හා කාන්තා සංවිධාන වලින් තෝරා ගත් (10) දහ දෙනෙකු බැගින් සහ අනෙකුත් අනුබද්ධ සංවිධාන වලින් තෝරා ගත් (05) පස් දෙනෙකු බැගින් ද වන සේ මහා සම්මේලනයට නියෝජිතයින් කැඳවිය යුතුය.

(ඈ) ඕනෑම සාමාජිකයකුට මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයෙන් හෝ තරුණ කාන්තා හා අනුබද්ධ සංවිධානවල අනුමැතිය ඇතිව හෝ සම්මේලන දිනට සති (04) හතරකට කලින් පක්ෂයේ ප්‍රධාන ලේකම් වෙත යෝජනා එවිය හැකිය. මෙම යෝජනා අතුරෙන්, මධ්‍යම කාරක සභාව අනුමත කරන යෝජනා පමණක් මහා සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

(ඉ) මහා සම්මේලනයේ මුලාසනය පක්ෂයේ සභාපති විසින් දැරිය යුතු අතර, පක්ෂයේ ප්‍රධාන ලේකම් වරයා විසින් ගත වූ සම්මේලනයක් පැවැත්වෙන සම්මේලනයත් අතර, පක්ෂය පිළිබඳ ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) ප්‍රතිපත්ති සංශෝධනය කළ හැක්කේ මහා සම්මේලනයටය. විධායක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති සංශෝධන යෝජනා කෙටුම්පත් මහා සම්මේලනයේදී සාකච්ඡා කොට සම්මත කරගත යුතුය.

## 18 වන වගන්තිය

### ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානය

මෙම සංවිධානයට පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ව්‍යවස්ථාවක් සම්මත කළ යුතුයි.

## 19 වන වගන්තිය

### ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාන්තා සංවිධානය

මෙම සංවිධානයට පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ව්‍යවස්ථාවක් සම්මත කළ යුතුයි.

## 20 වන වගන්තිය

### අනුබද්ධ සංවිධාන

මෙම ව්‍යවස්ථාවේ 2 වන වගන්තියේ 'ආ' කොටසේ සඳහන් අනුබද්ධ සංවිධාන සඳහා පක්ෂ ව්‍යවස්ථාවට පටහැනි නොවන ආකාරයට පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් යෝග්‍ය ව්‍යවස්ථාවන් අනුමත කළ යුතුයි.

## 21 වන වගන්තිය

### විශේෂ මණ්ඩල

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ හා කාන්තා සංවිධාන ඇතුළු සියළුම අනුබද්ධ සංවිධාන හා පක්ෂය අතර, සමීප සම්බන්ධතාවය පවත්වාගෙන යාමට ඉවහල් වන පරිදි විශේෂ මණ්ඩල පිහිටු වීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ. එම විශේෂ මංඩලයන්හි, වගකීම් හා කාර්‍ය භාරයන් මධ්‍යම කාරක සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ඇත.

## 22 වන වගන්තිය

### සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම්:

(I) වයස අවුරුදු 18 වැඩි ඕනෑම කෙනෙකුට පක්ෂයේ සාමාජිකත්වය විවෘතව පවතී. මාස (06) හයක් ගතවන තුරු ඔහු අපේක්ෂක සාමාජිකයෙකු ලෙස සැලකේ.

(II) වෙනත් දේශපාලන පක්ෂයකට බැඳී සිටින සාමාජිකයෙකුට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත නොහැකිය.

(III) එක පුද්ගලයෙකුට පක්ෂ ශාඛා දෙකක සාමාජිකත්වය එකවර තබා ගත නොහැකිය. අවශ්‍ය විටක තම සාමාජිකත්වය එක් ශාඛාවකින් තවත් ශාඛාවකට අදාළ ශාඛා දෙකේ අනුමැතිය ඇතිව මාරු කළ හැකිය.

## 23 වන වගන්තිය

### සාමාජිකත්වය ලබා ගන්නා ක්‍රමය:

(I) අවුරුද්දේ ඕනෑම දිනක බැඳිය හැකිය. එහෙත්, වාර්ෂික සාමාජිකත්වය දෙසැම්බර් 31 වනදයින් අවසන් වේ.

(II) (අ) සාමාජිකත්වාපේක්ෂකයකු නියමිත ආකෘති පත්‍රය පුරවා තමා පදිංචි ප්‍රදේශයේ ශාඛා සමිතියේ ස්ථිර සාමාජිකයන් දෙදෙනෙකුගේ යෝජනා ස්ථිරත්වය ඇතිව, එම වර්ෂයේ මුදල හා කාඩ් පතට නියමිත ගාස්තුවක් සමග තම ප්‍රදේශයේ ශාඛා සමිතියට ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලුම්කරුට අදාල මැතිවරණ බල ප්‍රදේශ සංවිධායක විසින්, කාඩ් පතක් නිකුත්කොට ඔහුගේ ඉල්ලුම් පත්‍රය පක්ෂ මූලස්ථානයට එවිය යුතුය. මාස (06) හයක පරීක්ෂණ කාලයකින් පසුව මෙම ඉල්ලුම්කරු කෙරෙහි කිසියම් විරෝධයක් මතු නොවුනහොත් පක්ෂ මූලස්ථානයෙන් සාමාජික අංකයත් හා සාමාජික කූපනයක්ද ලබා දී ඔහු පක්ෂයේ ස්ථිර සාමාජිකයකු වශයෙන් පිළිගනු ඇත.

(ආ) ශාඛාවක් නොමැති ප්‍රදේශයක ස්ථිර සාමාජිකයින් දෙදෙනෙකුගේ නිර්දේශ සහිතව අදල මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ සභාපති වරයාට ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ හැකිය.

(ඇ) ඕනෑම සාමාජිකත්වාපේක්ෂකයකුට තම ඉල්ලුම් පත්‍රය පිළිබඳව පක්ෂයේ ප්‍රධාන ලේකම් වරයාට අභියාචනා ඉදිරිපත් කිරීමට අවසර තිබේ.

## 24 වන වගන්තිය

### සාමාජික ගාස්තු

(I) සාමාජිකයෙක් රුපියල් පහක (5/-) වාර්ෂික සාමාජික මුදලක් ගෙවිය යුතුය. විධායක සභාව හෝ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන වෙනත්ආධාර මුදල් ගෙවීමටද සාමාජිකයෝ බැඳී සිටිති.

(II) සියළුම සමස්ථ ලංකා කාරක සභිකයන් විසින් වර්ෂයකට අතිරේක වශයෙන් රුපියල් පනහක් (50/-) ගෙවිය යුතුය.

(III) පක්ෂයේ සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතන වලට පත් වී සිටින පක්ෂයේ සියළුම සභිකවරු විසින් මධ්‍යම කාරක සභාව නිර්දේශ කරනු ලබන අනුග්‍රාහක සාමාජික මුදලක් වාර්ෂිකව ගෙවිය යුතුයි.

## 25 වන වගන්තිය

### සාමාජිකත්වය අළුත් කිරීම:

සෑම වර්ෂයකම ඔක්තෝම්බර් මස 01 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුල සාමාජික මුදල් ගෙවා, සාමාජිකත්වය අළුත් කළ යුතුයි.

## 26 වන වගන්තිය

### සාමාජිකයින් සතු වගකීම් හා අයිතිවාසිකම්:

(I) පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පළාත් සභා මන්ත්‍රීවරු සහ පලාත් පාලන ආයතන වල සභිකයින්ද ඇතුළුව, සෑම පක්ෂ සාමාජිකයෙක්ම, පක්ෂයේ ප්‍රතිපත්ති රැකීමටත්, අරමුණු මුදුන්පත් කර ගැනීමටත්, පක්ෂය ජනප්‍රිය කර වීමටත්, පක්ෂයේ තීරණ අනුව සැමවිටම ක්‍රියා කිරීමටත් දැඩි ලෙස බැඳී සිටී.

(II) සෑම සාමාජිකයෙක්ම පක්ෂයේ නීති රීති පිළිපැදීමට බැඳී සිටින අතර විනය ගරුකව ක්‍රියා කළ යුතුය.

(III) සියළු මැතිවරණ වලදී පක්ෂය විසින් නම් කරන අපේක්ෂකයන්ට උදව් හා ආධාර දීම සෑම සාමාජිකයෙකුගේම යුතුකමය.

(IV) සාමාජික අයදුම් පතක් පුරවා පක්ෂ මූලස්ථානය වෙත භාරදී (06) හය මසක පරීක්ෂණ කාලයකින් පසුව සාමාජික අංකයන්ද, ඇතිව ස්ථිර සාමාජිකයෙකු සතු අයිතිවාසිකම් හිමි වේ.

## 27 වන වගන්තිය

**සාමාජික ලේඛන හා නිළධාරී මණ්ඩල ලේඛන පවත්වා ගෙන යෑම.**

(I) පක්ෂයේ ප්‍රධාන ලේකම් වරයා සාමාජික හා සංවිධානවල නිළධාරී මණ්ඩල ලේඛන පවත්වා ගත යුතුය.

## 28 වන වගන්තිය

නිළවරණ:

මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ඨ සියළු සංවිධානවල නිළවරණ වාර්ෂිකව හෝ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කෙරෙන කාලය තුළ හෝ පැවැත්විය යුතුය.

## 29 වන වගන්තිය

පක්ෂ අරමුදල්

(I) පක්ෂයේ සභාපතිගේ සභාපතිත්වයෙන් යුක්තව භාණ්ඩාගාරිකද ඇතුළත් වනසේ පස් දෙනෙකුගෙන් යුත් මුදල් කාරක සභාවක් විධායක සභාව විසින් පත් කළ යුතුය.

(II) පක්ෂයේ විය හියදම් සඳහා අරමුදලක් ඇති කිරීමට මුදල් කාරක සභාව විසින් අවශ්‍ය විධි විධාන සැලසිය යුතුය.

(III) භාණ්ඩාගාරික විසින් පක්ෂයට ලැබෙන සියළුම මුදල් වලට කුවිතාන්සි යැවීම හා ගණන් තැබීම කළ යුතුය.

(IV) (අ) පක්ෂයට ලැබෙන්නා වූ මුදල පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ උපදෙස් පිට බැංකුවල පක්ෂයේ නමින් තැන්පත් කළ යුතුය. බැංකුවල තැන්පත් කරන ලද මුදල් ගනුදෙනු කළ යුත්තේ පක්ෂයේ සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික, යන තිදෙනාගෙන් දෙදෙනෙකුගේ අත්සන් ඇතිවය.

(ආ) සභාපතිගේ අනුමැතිය ඇතිව අවශ්‍ය හදිසි වියදමක් කිරීමට භාණ්ඩාගාරිකට බලය තිබේ. එසේ කරන ලද වියදම් ගැන විස්තරයක් මුදල් කාරක සභාවට වහාම වාර්තා කළ යුතුය. ගත වූ වර්ෂයේ අයවැය පිළිබඳව ගණන් පරීක්ෂකයන් විසින් සකස් කර මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද වාර්තාවක් සෑම වර්ෂයකම විධායක සභාවට ඉදිරිපත් කළ යුතුය.

## 30 වන වගන්තිය

**පක්ෂයේ චංචල හා නිශ්චල දේපල**

(I) මෙම ව්‍යවස්ථාවේ 29 වන වගන්තිය අනුව වෙනත් නියමයන්ට යටත් අරමුදල් හැර පක්ෂයේ සියළු චංචල හා නිශ්චල දේපල භාරකාර වශයෙන් පැවරෙන භාරකාර මණ්ඩලයක් සමන්විත විය යුතුය.

(II) (අ) එසේ පැවරෙන දේපොල නඩත්තු කිරීම හා පරිපාලනය භාරකාර මණ්ඩලයේ වගකීම වන්නේය.

(ආ) එම නඩත්තු කිරීමේ හා පරිපාලන කටයුතු සඳහා භාරකාර මණ්ඩලය විසින් සුදුසු නිළධාරින් පත්කළ හැක.

(III) භාරකාර මණ්ඩලය පහත සඳහන් ආකාරයට සකස් විය යුතුයි.

(අ) මණ්ඩලයේ සභාපති - මෙම තනතුර පක්ෂයේ සභාපති විසින්ද දැරිය යුතුය.

(ආ) පක්ෂයේ උප සභාපතිවරු අතුරින් මධ්‍යම කාරක සභාව විසින් නම් කරන දෙදෙනෙක්

(ඇ) පක්ෂයේ ප්‍රධාන ලේකම්

(ඈ) පක්ෂයේ භාණ්ඩාගාරික

(IV) විධායක සභාවේ සාමාජිකයින් අතරින් සුදුසු කෙනෙක් භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් පක්ෂයේ සභාපති විසින් පත්කළ හැක.

(V) (අ) මධ්‍යම කාරක සභාවේ සම්මත කරගත් තීරණයකින් පසු පක්ෂය විසින් චංචල හා නිශ්චල දේපල අත්පත් කර ගැනීම සඳහා පක්ෂයේ අරමුදල් ප්‍රයෝජනයට ගැනීම නිත්‍යානුකූල වන්නේය.

(ආ) එවැනි දේපල පක්ෂයට පවරන්නා වූ, පැවරීමේ ඔප්පු හෝ වෙනත් ලේඛනයන්ද භාරකාර මණ්ඩලයේ සාමාජිකයින්ගේ නමින් ලියා අත්සන් කල යුතුය.

(ඇ) එහෙත් දේපල භාරකාර මණ්ඩලයේ අනුමැතිය ඇතිව පක්ෂයේ පහත සඳහන් නිළධාරින් අතුරෙන් දෙදෙනෙකුගේ නමින් ලියා අත්සන් කළවිට එය පක්ෂයේ දේපල බවට පත් වන්නේය. සභාපති (සභාපතිට අත්සන් කළ නොහැකි අවස්ථාවල මධ්‍යම කාරක සභාව විසින් නම් කරන උප සභාපතිවරයෙකු) ප්‍රධාන ලේකම් හෝ භාණ්ඩාගාරික

(VI) කොළඹ 10, මරදානේ, ටී.බී. ජයා මාවතෙහි පිහිටා තිබෙන අංක 301 සහ 301 ඒ දරණ භූමිය හා එහි ගොඩනැගිලි හැර, මෙම ව්‍යවස්ථාව සම්මත වූ දින වන විට පක්ෂය සතු වූ හෝ අනාගතයේදී පක්ෂය සතුවන කවරම හෝ නිශ්චල හා චංචලදේපල විකිණීම, උගස්තැබීම, කුලියටදීම, බදුදීම සහවෙනත් එබඳු ඕනෑම ගනුදෙනුවක් සඳහා භාරකාරමණ්ඩලය ගන්නා

පියවර මධ්‍යම කාරක සභාවට දැන්විය යුතුය.

(VII) කොළඹ 10, මරදානේ, ටී.බී. ජයා මාවතේ පිහිටා තිබෙන අංක: 301 සහ 301 ඒ දරණ භූමිය සහ එහි ඇති ගොඩනැගිලි පිළිබඳව පහත සඳහන් නියමයන් බල පැවතිය යුතුයි.

(අ) එම දේපොල අවුරුදු 05 කට වැඩි කාලයක් බදුදීම හෝ උගස් කිරීම සඳහා භාරකාර මණ්ඩලය තීරණයක් ගතහොත් එය මධ්‍යම කාරක සභාව විසින්ද අනුමත කල යුතුව ඇත.

(ආ) එම දේපොල විකිණීම සඳහා භාරකාර මණ්ඩලය තීරණයක් ගතහොත් එය මධ්‍යම කාරක සභාවක් සමස්ථ ලංකා කාරක සභාවක් යන සභා විසින් ඒ ඒ සභාවේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයකින් අනුමත කළ යුතුව ඇත.

(VIII) පක්ෂයට සන්තක වූ කවරම දේපලක් පිළිබඳව හෝ ඔප්පුවක් හෝ වෙනත් ලියවිලි ඇතිකර ගැනීමට අවශ්‍යතාවයක් ඇතිවූ විටෙක එම ඔප්පු හා ලියකියවිලිද එකී භාරකාර මණ්ඩලය අත්සන් කළ යුතුය.

## 31 වන වගන්තිය

### පොදු විධි විධාන

(I) කිසියම් වර්ෂයක නව නිළධාරීන් පත්කරන තෙක් පැරණි නිළධාරීන් ක්‍රියාත්මක විය යුතුය.

.(II) මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ට කවරම සංවිධානයක හෝ අනු සංවිධානයක සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක (1/3) අත්සනින්, මාසයක් කල්දී කරන ලිඛිත ඉල්ලීමක් උඩ සංවිධානයේ හෝ අනු සංවිධානයේ ලේකම් හෝ සභාපති විශේෂ රැස්වීමක් කැඳවීමට වග බලා ගත යුතුය. එම ලිඛිත ඉල්ලීමේ රැස්වීම කැඳවීම හේතුව දැන්විය යුතු අතර, රැස්වීම කැඳවීම පිළිබඳ දැන්වීමේ එම හේතුව අඩංගු විය යුතුය.

(III) (අ) මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ට සංවිධානවල රැස්වීම් සඳහා සණපූරණය සාමාජිකත්වයෙන් තුනෙන් එකක් (1/3) සේ සැලකිය යුතුය.

(ආ) මෙම ව්‍යවස්ථාව යටතේ සංස්ථාපිත මධ්‍යම කාරක සභාව ඇතුළුව සියලුම මංඩලවල සාමාජිකයන්ගෙන්, කවරකු හෝ හේතු නොදන්වා, අදල මණ්ඩලයේ රැස්වීම් තුනකට අඛණ්ඩව නොපැමිණියේ නම් ඔහුගේ හෝ ඇයගේ එම මණ්ඩලයේ සාමාජිකත්වය තිරායාසයෙන්ම අහෝසි වන්නේය.

(IV) මෙම සංශෝධිත ව්‍යවස්ථාව අනුමත කරන අවස්ථාවේ පක්ෂයේ පැරණි ව්‍යවස්ථාවට අනුව පක්ෂ සාමාජිකත්වය දරමින් සිටි සියළු සාමාජිකයින් මෙම ව්‍යවස්ථාවට අනුව නීත්‍යානුකූල සාමාජිකයෝ වන අතර, ඔවුන්ද එසේම ඉන් පසුව පක්ෂයට බැඳෙන සාමාජිකයින්ද සෙසු ව්‍යවස්ථාවේ සෑම කොන්දේසියක්ම පිළිගැනීමට එකඟ වූ සේ සැලකෙයි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

(V) මෙම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කවර හෝ සංවිධානයක නිලධාරියකු හෝ එම සංවිධානයෙන් වෙනත් සංවිධානයකට තෝරාපත් කරගත් නියෝජිතයෙකු හෝ ඉල්ලා අස්වීමෙන් හෝ මොනම හේතුවකින් හෝ කිසියම් නිළයක් හෝ නියෝජිකත්වයක් පුරප්පාඩු වුවහොත්, ඊළඟ නිළවරණයේදී එම, පුරප්පාඩුවට කෙනෙකු තෝරා පත් කර ගන්නා තෙක් එකී පුරප්පාඩුව මධ්‍යම කාරක සභාව විසින් හෝ මධ්‍යම කාරක සභාවේ උපදෙස් පරිදි හෝ පිරවීමට අදාල සංවිධාන ක්‍රියා කළ යුතුයි.

(VI) මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් කරණු සම්බන්ධයෙන් අවශ්‍ය වන අතුරු ව්‍යවස්ථා රෙගුලාසි සකස්කර ඒවා ක්‍රියාත්මක කිරීමට පක්ෂයේ මධ්‍යම කාරක සභාව කටයුතු කළ යුතුය.

(VII) පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ අවසරය ඇතිව පක්ෂයට සම්බන්ධ වෙනත් සංවිධාන ගොඩනැගිය හැකි අතර ඒවා මෙම ව්‍යවස්ථාවට යටත් වේ.

(VIII) පක්ෂයේ මධ්‍යම කාරක සභාවට අදාළ දිස්ත්‍රික්කයන් තුල ඇති විය යුතු මැතිවරණ බල ප්‍රදේශ නිගමනය කිරීමට බලය ඇත.

## 32 වන වගන්තිය

(I) මෙම ව්‍යවස්ථාවට ඇතුලත් නොවූ ක්‍රියා මාර්ග පිළිබඳව යම් කාරණයක් පැන නැගුනහොත් හෝ ව්‍යවස්ථාවල සඳහන් යම් විධානයක් තේරුම් ගැනීම පිළිබඳව යම් සැකයක් ඇති වුවහොත් ඒ කාරණය මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

(II) මෙම ව්‍යවස්ථා පංතියේත් එහි ඉංග්‍රීසි හෝ දෙමළ පරිවර්තනයේත් යම් වෙනසක් ඇති වුවහොත් පක්ෂයේ කටයුතු සඳහා පිළිගනු ලබන්නේ මේ ව්‍යවස්ථාව මිස එහි ඉංග්‍රීසි හෝ දෙමළ පරිවර්තනය නොවේ.

- සිද්ධි රස්තු -

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

කොළඹ 10, ටී.බී. ජයා මාවතේ අංක 301 බී, පිහිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එස්.ඩබ්. ආරියරත්න වන මා විසින් අංක 255 කෝට්ටේ සලවතුගොඩ
පිහිටි එරාත් ප්‍රින්ට් ප්‍රයිවට් ලිමිටඩ් හි
මුද්‍රණය කරවන ලදී

Printed By Chirathprint (Pvt) Ltd. Tel: 868271